# කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව

# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

# දැන්වීමයි

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම - 2019**

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) - 2019 පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීමට තෝරාගත් ශිෂ්‍ය නාම ලේඛණය අපගේ වෙබ් අඩවියේ (www.cdce.kln.ac.lk) පළ කර ඇත.

මෙම පාඨමාලාව සඳහා ගාස්තුව රු. 86,000/= ක් වන අතර එය වාරික 05 කින් ගෙවීම සඳහා පහසුකම් සලසා දී ඇත. මීට අමතරව විශ්වවිද්‍යාලය මගින් නියම කරනු ලබන විභාග ගාස්තු ඔබ විසින් ගෙවිය යුතු වේ. ලියාපදිංචි කරගැනීම සඳහා වන පළමු වාරිකය රු.15,000/= කි. මෙම ගෙවීම් සඳහා පහත මාර්ගෝපදේශ අනුගමනය කරන්න.

1. ඒ සඳහා අපගේ **www.cdce.kln.ac.lk** වෙබ් අඩවියට පිවිසෙන්න. එහි **"New Registration"** නැමති අයිතමය තෝරාගන්න.

2. ඔබගේ අයදුම්පත් අංකය සහ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායා රූපයක් උඩුගත (Upload) කරන්න. ඉන්පසු ඔබට හිමි වවුචර්පත, ප්‍රකාශන පත්‍රය සහ නම, ලිපිනය, ඔබට අදාළ පාඨමාලාව සඳහන් පත්‍රිකාව මෙන්ම වාරික ගෙවීම් පිළිබඳ විස්තර පත්‍රිකාව දිස්වනු ඇත. එම පත්‍රිකාවේ සඳහන් තොරතුරු නිවැරදි බව ඔබ විසින් තහවුරු කිරීමෙන් පසු ඉහත ලේඛණ බාගත (Download) කරගන්න.

4. වවුචරයේ සඳහන් උපදෙස් අනුව එහි සඳහන් මුදල වවුචරයේ සඳහන් **ගිණුම් අංකයට පමණක්** ගෙවිය යුතුය.

5. පළමු වාරික මුදල (රු. 15,000/=) ඕනෑම මහජන බැංකු ශාඛාවකට **2022.05.15** දිනට පෙර ගෙවිය යුතුය. **(කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ගිණුමට බැර කරනු ලබන කිසිදු මුදලක් ආපසු නොගෙවන බව දන්වමි)**

6. මෙම දිනට හෝ ඊට පෙර ගෙවීම් නොකරන අපේක්ෂකයින් ලියාපදිංචිය සඳහා සලකා බලනු නොලැබේ.

7. මුදල් ගෙවීමෙන් පසුව බැංකුව විසින් ඔබ වෙත ලබාදෙනු ලබන කහ පැහැති පාරිභෝගික පිටපත සමග නිසි පරිදි අත්සන සහතික කරන ලද ප්‍රකාශන පත්‍රය, නිරවද්‍යතාවය තහවුරු කරන ලද තොරතුරු අඩංගු පත්‍රිකාව සහ පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායා රූප 02 ක් සමග පහත ලේඛණ වල සහතික කළ ඡායා පිටපත් අනිවාර්යයෙන් එවිය යුතුයි.

   - **උප්පැන්න සහතිකය,**
   - **ජාතික හැඳුනුම්පතේ පිටපතක්**
   - **අ.පො.ස (සා.පෙළ) සහතික**
   - **අ.පො.ස (උ.පෙළ) සහතික**
   - **වෙනත් සුදුසුකම් යටතේ ලියාපදිංචි වන්නේ නම් එම සහතිකය**
   - **පූජ්‍ය පක්ෂය සඳහා සාමණේර හෝ උපසම්පදා සහතිකය.**

**තව ද උප්පැන්න සහතික වල සහ අධ්‍යාපන සහතික අතර නම් වල වෙනසක් ඇත් නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක් එවිය යුතුය.**

**ප්‍රකාශන පත්‍රයේ අත්සන සහ ලේඛණ වල ඡායා පිටපත් සහතික කිරීම**

රජයේ විදුහලක විදුහල්පති වරයෙකු / ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරි / සාමදාන විනිශ්චයකාරවරයෙකු / නීතීඥවරයෙකු හෝ ඉහත තනතුරු දරණ රජයේ පිළිගත් ආයතනයක මාණ්ඩලික නිලධාරියෙකු විසින් සිදු කල යුතුය.

9. ලිපි කවරයේ වම්පස උඩ කෙළවරෙහි **"Bachelor of Arts - Registration - 2019"** ලෙස සඳහන් කර **2022.05.15** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කරන්න.

**ලිපිනය :-** **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි,**<br>
**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,**<br>
**තැ.පෙ. 03,**<br>
**කැලණිය විශ්වවිද්‍යාලය,**<br>
**කැලණිය.**

10. ඔබට ලබා දී ඇති විෂයයන් සඳහා බාහිර උපාධි අපේක්ෂකයින් අවම වශයෙන් 20 දෙනෙකුවත් ලියාපදිංචි නොවුනහොත් ලබා දිය හැකි වෙනත් විෂයයක් සඳහා මාරුවීමට සිදු වන බව දන්වමි.

**ඔබ ලබා දී ඇති තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට අපොහොසත් වුවහොත් ඔබගේ ලියාපදිංචිය අවලංගු කරන බව දන්වන අතර ගෙවා ඇති කිසිදු මුදලක් ආපසු නොගෙවන බව ද වැඩි දුරටත් දන්වමි.**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි,<br>
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය.<br>
කැලණිය විශ්වවිද්‍යාලය<br>
2022.05.29